*බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව*

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.11.25

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා.
05. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී යූ.එච්. ගාමිණී මැතිතුමා

**සහභාගීනොවූවෝ:-**

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර ලේකම්

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම් මහතා සහ පුවත්පත් කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

ගරු සභාපතිතුමා කථා කරමින් , අතිගරු ජනාධිපතිතුමන්ගේ අභිමානවත් දෙවන පදවි ප්‍රාප්තියට බළන්ගොඩ නගර සභාවේ සුභාශිංසනය පළකරන අතර , ජාතියේ ඉදිරිගමන ශක්තිමක් කිරීමට එතුමාට ශක්තිය , ධෛර්ය හා වාසනාව ලැබේවා යි ඉත සිතින් ප්‍රාර්ථනය කරන බව පළමුවෙන්ම පැවසීය.

වැඩිදුරටත් කථාකල ගරු සභාපතිතුමා , 2011 වර්ෂය සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් වර්තමානයට හා අනාගතයට ගැලපෙන සේ සකස් කල ඉතා හොඳ සංවර්ධිත අයවැයක් ඉදිරිපත් කර තිබෙන බැව් දැන්වීය.

වසර ගණනාවක් පුරාවට පැවති කුරිරු කොටි ත්‍රස්තවාදය තුරන් කිරීම , සුනාමි ව්‍යසනයට ලක්වීම වැනි අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී රට දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් කරා මෙහෙයවමින් රටේ ජනතාවට සහන ලබාදෙමින් , සෑම අංශයක්ම දිරිගන්වමින් , ජනතාවට වඩා දීප්තිමත් අනාගතයක් උදාකිරීම සඳහා ඉදිරිපත් කල අයවැයක් ලෙස සලකනු ලබන බැව් දැන්වීය.

තවදුරටත් කථාකල ගරු සභාපතිතුමා , අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන මහින්ද චින්තන වැඩ සටහන යටතේ ගම නැගුම ,මග නැගුම වැනි සංවර්ධන වැඩ සටහන් හරහා බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ සුවිශාල වූ සංවර්ධනයක් සිදුකිරීමට හැකි වූ බව සඳහන් කරන අතර , අතිගරු ජනාධිපතිතුමන්ට ඒ සම්බන්ධව සිය ස්තූතිය පළකරන බවද සඳහන්කරන ලදී.

මෙම නගර සභාව විසින් සිදුකල සංවර්ධන කාර්යයන් සාර්ථක කරගැනීමට මෙම සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයෙන් විශාල සහයෝගයක් ලැබුණු බව සඳහන් කරන අතර , ඒ සම්බන්ධවත් සිය ප්‍රණාමය පළකරන බැව් දැන්වීය.

සබරගමුව පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා මෙම සභාවේ සංවර්ධන කටයුතු වලට මුදල් ප්‍රතිපාදන වෙන්කරදීම, යන්ත්‍ර සූත්‍ර ලබාගැනීමට ප්‍රතිපාදන වෙන්කරදෙමින් ,අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම ලබාදෙමින් දක්වන ලද සහයෝගයට බළන්ගොඩ නගර සභාවේ ගෞරවය පළකරන අතරම, පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා, පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් ද ලැබුණු සහයෝගය අගය කරන අතර ඒ සම්බන්ධවත් සිය ස්තූතිය පළකරන බැව් දැන්වීය.

2011 වර්ෂය සඳහා මෙම නගර සභාව ද ජනතාවගේ බලාපොරොත්තු සඵල කිරීමට හැකිවන අයවැයක් ඉදිරිපත්කර ඇති අතර , එය අධ්‍යයන කර සම්මත කරගැනීමට කටයුතු කරනලෙස තමා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බව දන්වමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**(03) 2010.10.27 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව හා 2010.11.10 දින පැවති විශේෂ මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2010.11.10 වන දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී තමන් ඉදිරිපත් කල අදහස් සභා වාර්තාවේ සටහන් වී නොමැති බැවින් ඒ සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන බව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් දැන්වීය.

එම වාර්තාවේ 12 වන පිටුවේ " 2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂාවෙන් යෝජනා රැසක් අයවැයට ඉදිරිපත් කර ඇති බවත් , ඒතුළින් නගරයේ පිරිසිදුකම රැකගැනීම සඳහා අලංකාර වූ බාස්කට් කණුවල එල්ලා තැබීම/නගරයට ග්‍රාම නිලධාරී කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඉඩකඩ වෙන්කිරීම ඉන් කිහිපයක් බැව් අවධාරණය කල අතර , 2011 වර්ෂයේ දී එම යෝජනාවන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. " යනුවෙන් සඳහන් වී ඇති බවත් , " එය 2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂාවෙන් යෝජනා රැසක් අයවැයට ඉදිරිපත් කර ඇති බවත් , ඒතුළින් නගරයේ පිරිසිදුකම රැකගැනීම සඳහා අලංකාර වූ බාස්කට් කණුවල එල්ලා තැබීම/නගරයට ග්‍රාම නිලධාරී කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඉඩකඩ වෙන්කිරීම සහ නගර සීමාවේ ජීවත්වන තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතාවයන් දියුණු කිරීම සඳහා ක්‍රීඩාපිටියක් සකස් කිරීම ඉන් කිහිපයක් වන බැව් අවධාරණය කල අතර , 2011 වර්ෂය තුළ එම යෝජනාවන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇතැයි තමන් අපේක්ෂා කරන බව පැවසීය" යනුවෙන් සංශෝධනය විය යුතු බවත්,මෙම නගර සභාව විසින් සිදුකල කාර්යයන් සාර්ථක කරගැනීමට සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර අභාවප්‍රාප්ත මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා සුවිශේෂී වූ දායකත්වයක් සහ මගපෙන්වීමක් මෙම සභාව සභාව වෙත ලබාදුන් බව ගෞරවයෙන් යුතුව සඳහන් කරන අතර, වර්තමාන සභාවට මුළින් ලක්ෂ 30 මුදලක් සංවර්ධන කාර්යයන් වෙනුවෙන් ලබාදෙනු ලැබුවේ ගරු මොහාන් එල්ලාවල මැතිතුමා වන බැව් සඳහන් කල අතර එතුමා බළන්ගොඩ නගර සභාවට පමණක් නොව සබරගමුව

පළාතටම සිදුකල අමිල මෙහෙවර සදා අමරණීය වන බව සඳහන් කරන ලදී." යනුවෙන් සභා වාර්තාව සංශෝධනය විය යුතු බැව් දැන්වීය.

ඉහත සඳහන් සංශෝධනයන්ට යටත්ව 2010.11.10 වන දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව හා 2010.10.27 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් එම වාර්තාවන් සභා සම්මත විය.

සභා රැස්වීමේ දී ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කරනු ලබන අදහස් සියල්ල කෙටිකර සංක්ෂිප්ත වාර්තාවක් සකස් කරන අතර , ඉතා වැදගත් වනුයේ ගනු ලබන තීරණයන් වන බව ගරු සභාපතිතුමන් විසින් පැහැදිලි කරන ලදී. සභා රැස්වීම් වල ගරු මන්ත්‍රීවරුන් විසින් කරනු ලැබූ ප්‍රකාශයන් සභා වාර්තාව මුද්‍රණය කිරීමට පෙර ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ඉදිරිපත් කර නිවැරදි යැයි පරීක්ෂා කරවාගෙන එය නිවැරදි බවට එතුමන්ලාගෙන් අත්සනක් ලබාගැනීමට තීරණය කරන ලදී. එසේම ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා දින 07 කට පෙර න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ලබාදෙන ලෙස ලිඛිතව දැනුම්දුන්න ද ඒ කෙරෙහි නිසි සැලකිල්ලට නොදක්වනු ලබන බවත් , එබැවින් ඒ කෙරෙහි ද සැලකිලිමත් වී ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා සභා රැස්වීම පැවැත්වීමට දින 07 පෙර ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන ලදී.

(04) **පසුගිය සභා වාර්තාව සමාලෝචනය කිරීම:**

නැත

05:01 **විද්‍යාත්මක පත්‍රිකා ඉදිරිපත් කිරීම**

**Night Soil Treatment Project**

**බළන්ගොඩ නගර සභාව - ඩකා විශ්ව විද්‍යාලය - බංගලාදේශය**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නගරසභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන මල අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධතියේ ක්‍රියාත්මක ක්‍රමවේදය විද්‍යානුකූලව පිළිගැනීම සඳහා එය විශ්ව විද්‍යාලයකින් සහතික කරගත යුතුය. මෙම නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන කොම්පෝස්ට්කරණ ක්‍රියාවලිය මේ ආකාරයටම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් පසුගිය වර්ෂයේ සහතික කරනු ලැබූ අතර , ඒ ආකාරයටම මල අපද්‍රව්‍ය ප්‍රතිකාරක ක්‍රමවේදය සහතික කරගැනීම සඳහා බංගලාදේශයේ ඩකා විශ්ව විද්‍යාලයේ විද්‍යාත්මක සැසිය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව විද්‍යාත්මක පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර , අදාළ විද්‍යාත්මක ක්‍රමවේදය එම විශ්ව විද්‍යාලය මගින් පිළිගෙන ඇති අතර , එම ක්‍රමවේදය ප්‍රසිද්ධ කිරීමට පෙර ඒ පිළිබඳව සැසියක් 2011.01.08 සිට 2011.01.10 දින දක්වා බංගලාදේශයේ ඩකා විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන බැවින් ඊට සහභාගීවන ලෙසත් දන්වා ඇත.

මෙම ක්‍රමවේදය විශ්ව විද්‍යාලයකින් සනාථ කරගැනීම අත්‍යාවශ්‍ය වන බැවින් , එම කරුණු ඉදිරිපත් කිරීමට බංගලාදේශයට යාමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලන අතර, මේ සඳහා ලියාපදිංචි වීමේ ගාස්තුව ලෙස ඇමරිකානු ඩොලර් 100 වන මුදල අදාල විශ්ව විද්‍යාලයට ගෙවන ලදී.

මෙම ගමන සඳහා දළ වශයෙන් පහත සඳහන් පරිදි වියදමක් දැරීමට අවශ්‍ය වන බැවින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

| | |
|---|---|
| i. බංගලාදේශයට යාමට හා ඒමට ගුවන් ටිකට්පත් ( මිහින් එයාර් ) | 60,000.00 |
| ii. නවාතැන් ගාස්තු | 40,000.00 |
| iii. ලියාපදිංචි ගාස්තු | 15,000.00 |
| එකතුව | 115,000.00 |

වියදම් වන මුදලින් රු.100,000/- ක මුදලක් ලර්න් ඒෂියා ආයතනයෙන් ලබාදෙන බැවින් , ඉතිරි රු.15,000/- ක මුදල ගරු අමාත්‍යතුමන්ගේ අනුමැතියට යටත්ව සහා අරමුදලින් දරා මෙම නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්.ඒ.එන්.ප්‍රේමතිලක මහතා ඉහත සඳහන් විද්‍යාත්මක සැසිය සඳහා සහභාගීකරවීම සුදුසු යැයි ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

05:02 **මාර්ග රක්ෂිතයේ නාම පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීම**

ඉහත සඳහන් කරුණට අදාළව පැල්මඩුල්ලමාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු විසින් එවා ඇති 2010.11.19 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පැල්මඩුල්ල විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් බළන්ගොඩ,රාස්සගල උස්වැල්ල මාර්ගයේ 1/3 ස්ථානයේ මෙම නගර සභාව විසින් සවිකර ඇති නාම පුවරු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවීම් කර ඒ සඳහා දින 07 ක් ඇතුළත අවසර ලබාගන්නා ලෙසත් , එසේ ගෙවීම් කිරීමට අපොහොසත් වේ නම් , අදාළ නාම පුවරුව එම ස්ථානයෙන් ඉවත්කිරීමට සිදුවන බවත් එමගින් දන්වා තිබිණ.

මෙම දැන්වීම මෙම නගර සභාව විසින් ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් යුතුව ප්‍රදර්ශනය කර ඇති අතර , ව්‍යාපාරික අරමුණකින් සිදුකර නැත. මෙවැනි දැන්වීම් සඳහාත් මුදල් අයකරන්නේ නම්, මාර්ග සවර්ධන අධිකාරිය විසින් නගර සභාව සීමාව තුළ නඩත්තු කළ යුතු මාර්ග හා ඒවායේ කාණු නිසි පරිදි පවිත්‍ර කරන ලෙස දැන්වීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **20% ක අත්තිකාරම් මුදලක් ලබාගැනීම:**

බළන්ගොඩ , ඇල්ලෙපොල වැවේගෙදර මාර්ගයේ වැඩ ආරම්භ කිරීම සඳහා 20% ක අත්තිකාරමක් ලබාදෙන ලෙස ඉල්ලා , බළන්ගොඩ , තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ඉදිරිපත් කරන ලද ලිපියක් සභාගත කරන ලදුව, එම ඉල්ලීම බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **කොන්ක්‍රීට් කරන ලද මාර්ගයක දෙපස කාණු දමා සැකසීම:**

ඉහත සඳහන් කරුණට අදාළව ඕළුගන්තොට , මෙගොඩ කිරිඳිගල අංක: 973/ ඒ දරණ ලිපිනයේ පදිංචි ඒ.එච්.කේ.ආර්.චමින්ද යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඕළුගන්තොට , රබර්වත්ත , සියඹලාගහවත්ත යා කෙරෙන කොන්ක්‍රීට් පාරේ මේවන විට වතුර බැසයාම සඳහා කාණු පද්ධතියක් නොමැති අතර , ඉන් පහළ පිහිටි ඉඩම් වලට ජලය බැසයාම නිසා දැඩි ලෙස ඉඩම් බාදනයට ලක්වීම සිදුවන බැවින් ඉතා ඉක්මණින් මේ පිළිබඳව ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස එමගින් දන්වා තිබිණ.

කාණුව සකස් කිරීමට දැනට සභාවේ මුදල් නොමැති බැවින් , කාණුව වසා ඇති අයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා ග්‍රාම නිලධාරී මහතා වෙත දැණුම් දීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **නගර සභාව සතු වාහන 2011 වර්ෂයට රක්ෂණය කිරීම:**

2010.12.25 වන දිනෙන් සභාවේ වාහනවල රක්ෂණ කාල සීමාව අවසන් වන බැවින් , මෙම වාහන ඉදිරි වර්ෂයට රක්ෂණය කලයුතු බැවින් , පහත සඳහන් මිළ ගණන් ගෙවා එම වාහන රක්ෂණය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

| අනු අංකය | වාහන අංකය | ගෙවිය යුතු මුදල |
|---|---|---|
| 01 | ND 5124 වෑන් රථය | 98217.64 |
| 02 | 56 1906 කෲ කැබ් රථය | 19499.46 |
| 03 | UQ 1933 යතුරු පැදිය | 5511.02 |
| 04 | VI 1833 යතුරු පැදිය | 9584.86 |
| 05 | RB 4786 ට්‍රැක්ටරය | 15203.78 |
| 06 | HF 2234 ට්‍රේලරය | 1395.96 |
| 07 | HF 2269 ට්‍රේලරය | 1221.04 |
| 08 | 46-4907 ට්‍රේලරය | 1853.11 |
| 09 | 46-3164 ට්‍රේලරය | 1955.73 |
| 10 | 67-1565 ට්‍රේලරය | 1629.30 |
| 11 | 67-3301 ජල බවුසරය | 2328.91 |
| 12 | 44-7142 ට්‍රේලරය | 1699.16 |
| 13 | 37-7933 ට්‍රැක්ටරය | 6873.45 |
| 14 | 227-5020 ගලි බවුසරය | 29119.26 |
| 15 | 226-7521 ටිපර් රථය | 19822.58 |
| 16 | QL-2901 ත්‍රීරෝද රථය | 9840.84 |
|  | එකතුව | 225756.16 |

අදාල මුදල් ගෙවා ඉහත සඳහන් වාහන රක්ෂණය කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 **20% ක අත්තිකාරමක් ලබාගැනීම :**

බළන්ගොඩ , වැකුඹුර කනත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා 20% ක අත්තිකාරමක් ලබාදෙන ලෙස ඉල්ලා , තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ඉදිරිපත් කරන ලද ලිපියක් සභාගත කරන ලදී.

මෙම ඉල්ලීමය සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **වරිපනම් බදු සහන ඉල්ලීම - 2011**
**වරිපනම් අංකය : 47- හපුතලේ පාර**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , ප්‍රධාන වීදිය, අංකඃ 49 ටී.එච්.සී.බී.මංජුල තේනුවර විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පිට්ටනිය වටා තනවා ඇති ජලය බැසයාමේ කාණු පද්ධතිය ( නගර සභා වෙළඳපල පසු පසින් ඉදි වී ඇති කාණුව ) නියමාකාරව ජලය බැසයාම සඳහා ඉදිවී නැතිවීම හේතුකොටගෙන තමා පදිංචි නිවසේ බිම් මහල නිරන්තරයෙන් වැසි ජලයෙන් යට වී යන අතර , මෙය ගොඩනැගිල්ලේ පැවැත්මට ද තර්ජණයක් වනවා මෙන්ම , සෞඛ්‍ය ගැටළුද නිර්මාණය වන අතර , එම කොටස කාලාන්තරයක් තිස්සේ ප්‍රයෝජනයට ගත නොහැකිව ඇති බැවින් , කාණු පද්ධතිය නියමාකාරව ඉදිකරනතුරු වරිපනම් අංකඃ 47 ට වරිපනම් බදු සහනයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

2011 වර්ෂය සඳහා ද වාර්ෂික බදු මුදලින් 50% කින් වරිපනම් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **නිවාඩු අනුමත කිරීම :**

වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා 2010.11.25 වන දින සායනයට සහභාගීවීමට නියමිතව ඇති බැවින් , 2010.11.25 වන දින පැවැත්වීමට නියමිත මාසික මහාසභා රැස්වීමට සහභාගීවීමට නොහැකි බැව් දන්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **මාර්ගයට අවහිරව ඇති විදුලි කණු ඉවත් කිරීම :**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , තුඹගොඩ,බැංකියවත්ත, ජල ටැංකිය පාර යන ලිපිනයේ පදිංචි නිමල් කුරේ මහතා විසින් ඉදිරිපත් කර ඇති 2010.11.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සභාව මගින් මග නැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරගෙන යනු ලබන කිරිඳිගල තුඹගොඩ ගම්මානය යා වෙන ජල ටැංකිය පාර ඉදිකිරීම පිළිබඳ ප්‍රදේශවාසීන්ගේ ගෞරවය පළකරඇති අතර , පාරට අවහිරව ඇති විදුලි කණු ( 03 ) ඉවත් කරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

බළන්ගොඩ විදුලි අධිකාරිය වෙත දන්වා නොමිලයේ මෙම විදුලි කණු තුන ඉවත් කරවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:10 **වරිපනම් බදු සහන ඉල්ලීම - වර්ෂ 2011**
**වරිපනම් අංකඃ 49 1/1 හපුතලේ පාර**

වරිපනම් අංකඃ 49 1/1 ගොඩනැගිල්ල ( වරිපනම් අංකඃ 49 සහ 51 උඩු මහල ) වසර ගණනාවක සිට ව්‍යාපාර කටයුත්තකට යෙදවීමට හැකියාවක් නොලැබුණ බැවින් , එම ගොඩනැගිල්ල නැවත ව්‍යාපාර කටයුත්තකට යොදවනතුරු වරිපනම් බදු සහනයක් ලබාදෙන ලෙස ඉල්ලා , බළන්ගොඩ , ප්‍රධාන වීදිය, අංකඃ 49 ටී.එච්.සී.බී.මංජුල තේනුවර අය විසින් ඉදිරිපත් කර ඇති 2010.11.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ව්‍යාපාරයක් ආරම්භ කරන තෙක් 2011 වර්ෂයට 50% කින් වරිපනම් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 **වරිපනම් බදු සහන ඉල්ලීම - වර්ෂ 2011**
**වරිපනම් අංකඃ 45 1/1 හපුතලේ පාර**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , අංකඃ 49 ප්‍රධාන වීදිය යන ලිපිනයේ පදිංචි ටී.එච්.ටී.ඩී.තේනුවර මහතා විසින් ඉදිරිපත් කර ඇති 2010.11.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වරිපනම් අංකඃ 45 1/1 ගොඩනැගිල්ල ( වරිපනම් අංකඃ 45 ඉහල මාළය ) දැනට වර්ෂ හතරක පමණ කාලයක සිට කිසියම් ව්‍යාපාරයක් සඳහා බදුදීමට නොහැකි වු බැවින් , ව්‍යාපාරයක් අරඹනතුරු වරිපනම් බදු සහනයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ව්‍යාපාරයක් ආරම්භකරනතුරු 2011 වර්ෂය සඳහා වරිපනම් 50% කින් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:12 කර්මාන්ත සඳහා වැලි ලබාගැනීම**

මෙම දිනවල පවතින අධික වර්ෂාව නිසා වැලි සැපයුම්කරු විසින් ප්‍රමාණවත් පරිදි වැලි සැපයීම නොකරනු ලබන බැවින් , වෙනත් සැපයුම්කරුවෙකු ලවා වැලි ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

වැලි ලබාගැනීමේ දුෂ්කරතාවයක් පවතින බැවින් , දැනට පවතින මිළ ගණන් වලට අනුකූල වන පරිදි මිළ ගණන් කැඳවා වෙනත් සැපයුම්කරුවෙකු වෙතින් වැලි ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:13 කොම්පෝස්ට් බඳුන් ලබාගැනීම**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ නගර වසම ග්‍රාම නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති 2010.11.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශ ආනන්දනීය නගරයක් බවට පත්කිරීමේ සංකල්පය යටතේ ක්‍රියාත්මක කරන විධිමත් කසළ ඉවත් කිරීමේ වැඩ සටහන මගින් ක්‍රියාත්මක කරනු ලබන කොම්පෝස්ට් ව්‍යාපෘතිය යටතේ බළන්ගොඩ නගරයේ පදිංචි නම්කර ඇති අයට නොමිලයේ කොම්පෝස්ට් බඳුන් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට සහනයක් වශයෙන් රු.580/- ක මුදලක් අයකර ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:14 කසළ ඉවත්කිරීමේ හා පොදු වැසිකිළි නඩත්තු කිරීමේ සේවාව ටෙන්ඩර් කිරීම - 2011**

බළන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය අංශයේ පහත සඳහන් සේවාවන් පවත්වාගෙන යාම සඳහා 2011 වර්ෂයට ලංසු කැඳවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

- කසල ඉවත් කිරීමේ සේවාව
- පොදු වැසිකිළිය බස්නැවතුම්පොළ
- පොදු වැසිකිළිය මහජනපොළ

අදාළ සේවාවන් පවත්වාගෙන යාම සඳහා 2011 වර්ෂයට ලංසු කැදවීමටත් , භාෂා තුනෙන්ම දැන්වීම් පළකිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:15 පාසල් 3 ඍ වැඩ සටහන**

බළන්ගොඩ නගරයේ පාසල් 10 ක ක්‍රියාවට නංවා ඇති 3 R වැඩ සටහන ජපානයේ පාසැල්වල ක්‍රියාත්මක වන 3 R වැඩ සටහන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ඇති අතර , ඒ සඳහා 3 R සමාජවල සාමාජිකයින් සඳහා විද්‍යුත් තැපැල් සකස් කරගැනීමටත් , අදාළ තොරතුරු අන්තර්ජාලය හරහා හුවමාරු කරගැනීමත් සඳහා සියලුම 3 R සාමාජිකයින් සඳහා නගර සභාවේ විද්‍යුණන පියසේ අන්තර්ජාල පහසුකම් ලබාගැනීමටත් , ඒ සඳහා අවසර පත්‍රයක් ලෙස වලංගු පොයින්ට් කාඩ්පතක් භාවිතා කිරීමටත් අනුමැතිය ලබාදෙන ලෙසත් , අදාල පරිගණක පුහුණු වැඩසටහන් පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු මගින් සිදුකරගැනීමටත් එමගින් අනුමැතිය ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:16 **2011 වර්ෂයට කුකුළු මස් කඩය ටෙන්ඩර් කිරීම :**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරනලදී.

2011 වර්ෂයට කුකුළු මස් කඩය ටෙන්ඩර් කිරීමේ දී මොහොමඩ් රියාස් බුහාර් මයා රු.360200/- ක් වන වැඩිම ටෙන්ඩරය ඉදිරිපත් කර ඇති නමුත් , ඔහුට ඝාතනය සඳහා පරිසර බලපත්‍රයක් නොමැති බැවින් , දෙවන ටෙන්ඩර්කරු වන එම්.එස්.ෆවුම් ස්මයිල් මහතාගෙන් රු.360200/- ක මුදලට ටෙන්ඩරය ලබාගැනීමට කැමැත්ත විමසන ලදී. ඔහු විසින් ඉදිරිපත් කර ඇති 320250/- ක මුදලට ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර , ඝාතනය සඳහා පරිසර බලපත්‍රය ද ලබාගෙන ඇති බැව් දැන්වුවද එය ඉදිරිපත්කර නොතිබු බැවින් , මේ සම්බන්ධව සුදුසු තීරණයක් ගන්නා ලෙස එමගින් ඉල්ලා තිබිණ.

නැවත ටෙන්ඩර් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:17 **රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ 2007.11.26 දින බළන්ගොඩ නගර සභාවේ දී සිදුකරන ලද භාෂා විගණනය අවසානයේ දී පෙන්වා දුන් පරිදි පහත සඳහන් අවශ්‍යතා ඉටුකරගැනීම පිළිබඳ වර්තමාන තත්ත්වය දන්වා එවන ලෙස ඉල්ලා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවා ඇති 2010.10.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

01. විමසීම් කවුළුවට හා දුරකථන හුවමාරුවට දෙමළ,සිංහල හා ඉංග්‍රීසි කථා කල හැකි නිලධාරියෙකු යෙදවීම.
02. දෙවන භාෂා ඉගැන්වීම සඳහා පන්ති පැවැත්වීම/නිලධාරීන් පුහුණු පන්ති වලට සහභාගී කරවීම පිළිබඳ ප්‍රගතිය කෙසේද?
03. නාම පුවරු , මෙහෙයුම් පුවරු සහ සංඥා පුවරු භාෂාත්‍රයෙන්ම සකස් කරතිබීම
04. දිනපතා අවශ්‍යතා සඳහා භාවිතා කරන සිංහල ආකෘති පත්‍ර දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.
05. දෙමළ භාෂා ප්‍රවීණත්වය ඇති නිලධාරියෙකු පත්කරගැනීම.

දැනට පවතින ප්‍රගතිය දැන්වීමටත් භාෂා පරිවර්තකයෙකු පත්කර එවන ලෙසත් ඉල්ලීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:18 **නිවස ඉදිරිපිට ඇති පාරට බෝක්කුවක් ලබාගැනීම:**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ , තුඹගොඩ , වෙට්නෝල් පාර අංක: 18 සී දරණ ලිපිනයේ පදිංචි ගුණපාල මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති 2010.11.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

අංක: 18 සී දරණ නිවසට වැසි වතුර වලින් හානි සිදුවන නිසා නිවස ඉදිරිපිට ඇති පාරට බෝක්කුවක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව වැඩ අධිකාරී මහතා ලවා පරීක්ෂා කිරීමටත් ඒ අනුව ක්‍රියාකිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:19 අතිගරු ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්ති මහෝත්සවය සහ පදවි ප්‍රාප්ති සැමරුම් සතිය 2010.11.15 දින සිට 2010.11.22 දින දක්වා**

ඉහත සඳහන් කරුණට අදාළව පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් විසින් එවා ඇති ලිපියක් ගරු සභාවේ දැනගැනීම පිණිස සභාගත කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ දෙවන පදවි ප්‍රාප්තිය සැමරුම නිමිත්තෙන් 2010.11.15 දින පැවති " දැයට සෙවන " ජනාධිපති රුක් රෝපණ වැඩ සටහන වෙනුවෙන් පළාත් පාලන ආයතන මට්ටමින් විවිධ රුක් රෝපණ වැඩ සටහන් ඉතා සාර්ථකව සංවිධානය කිරීම පිළිබඳව පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩලයේ සියළුම දෙනාට ප්‍රශංසාව සහ ස්තුතිය පළකර ඇති අතර , මෙම වැඩ සටහනට සමගාමීව පළාත් පාලන ආයතනය විසින් සිටුවන ලද පැළවර්ධනය කරගැනීම හා රැකබලාගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය පරිසර අමාත්‍යාංශයෙන් ලබාගත හැකි අතර , සිටුවන ලද ශාක මැනවින් රැකබලා ගැනීම උනන්දුවෙන් සහ කැපවීමෙන් සිදුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පළාත් පාලන ආයතන මට්ටමින් රෝපණය කරන ලද ශාක පිළිබඳ විස්තර වාර්තාවක් නොපමාව එවන ලෙස එමගින් දන්වා තිබිණ.

**05:20 ඇස්තමේන්තු මුදල ආපසු ගෙවන ලෙස දැන්වීම**

මෙම නගර සභාව වෙත ඉදිරිපත්කර ඇති අංකඃ බනස/ක/3/66/48/10 දරණ ගොඩනැගිලි අයදුම්පතේ අයිතිකරුවන ඒ.අයි.ආරියවංශ මහතා වැවේළිඳ පාරේ ජේ.සී.බී.යන්ත්‍රය යොදා ගෙපළක් කපා පාර විනාශකර ඇති බැවින් , විනාශ කල පාර සඳහා ඇස්තමේන්තු මුදල ගෙවනතෙක් ගොඩනැගිලි අයදුම්පත ද අනුමත නොකළ බවත් , මේවන විට කාර්මික නිලධාරී මහතා විසින් ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර , එම මුදල ඔහුගෙන් අයකරගැනීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාළ ඇස්තමේන්තු මුදල ගෙවන ලෙස දැණුම්දීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**09:21 www.balangoda.uc.gov.lk වෙබ් අඩවිය පවත්වාගෙන යාම ඃ**

බළන්ගොඩ නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඉහත සඳහන් වෙබ් අඩවිය වෙනුවෙන් 2010 ජුලි මස සිට 2011 ජුලි දක්වා රු.10497.75 ක මුදලක් පූර්ණි ඉන්සිපෙරේෂන්ස් පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු බැව් එම ආයතනය විසින් දන්වා තිබිණ.

අදාළ මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**5:22 වැය මාරු කිරීම**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

| ප්‍රතිපාදන ඉතිරි වැය ශීර්ෂය | විස්තරය | මුදල | ප්‍රතිපාදන අවශ්‍ය වැය ශීර්ෂය | විස්තරය | මුදල |
|---|---|---|---|---|---|
| 1-1-481 | විශ්‍රාම වැටුප් (පා.පා.විශ්‍රාමික) | 200,000 | 1-1-453(ii) | අවශ්‍යතා - ජලය | 30,000.00 |
| 1-2-481 | වැටුප් හා වේතන | 1,000,000 | 1-4-411 | වැටුප් හා වේතන | 70,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1-2.412 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 100,000 | 2-1-416 | ජීවන වියදම් දීමනා | 50,000.00 |
| 1-2-416 | ජීවන වියදම් දීමනා | 300,000 | 2-1-431 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල | 20,000.00 |
| 1-3-431 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 200,000 | 2-3-416 | ජීවන වියදම් දීමනා | 75,000.00 |
| 1-3-458 | මුද්‍රණ සේවා ( දැන්වීම් ගාස්තු) | 25,000 | 2-9-411 | වැටුප් හා වේතන | 4,226,000.00 |
| 1-4-412 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 25,000 | 2-9-416 | ජීවන වියදම් දීමනා | 1,000,000.00 |
| 2-3-421 | ගමන් වියදම් ( දේශීය ) | 5,000 | 2-9-435 | මිළදී ගැනීම් | 100,000.00 |
| 2-4-421 | ගමන් වියදම් ( දේශීය ) | 20,000 | 3-1-431 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල | 100,000.00 |
| 2-3-459 | වෙනත් ( ආහාර පරීක්ෂන) | 25,000 | 3-3-518 | වැටුප් හා වේතන | 625,000.00 |
| 2-4-411 | වැටුප් හා වේතන | 1,750,000 | 3-4-411 | වැටුප් හා වේතන | 829,000.00 |
| 2-5-412 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 100,000 | 5-2-411 | ජීවන වියදම් දීමනාව | 275,000.00 |
| 2-5-416 | ජීවන වියදම් දීමනා | 750,000 | 5-2-416 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ (පුවත්පත් ) | 150,000.00 |
| 2-5-411 | වැටුප් හා වේතන | 500,000 | | | |
| 3-1-412 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 150,000 | | | |
| 3-1-416 | ජීවන වියදම් දීමනා | 150,000 | | | |
| 3-1-441 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 1,000,000 | | | |
| 3-3-442 | අලුත්වැඩියා නඩත්තු ඉදකිරීම් | 200,000 | | | |
| 3-1-451 | ප්‍රවාහන | 200,000 | | | |
| 3-1-442 | අලුත්වැඩියා නඩත්තු ඉදිකිරීම් | 100,000 | | | |
| 3-1-451 | සම්බන්ධිත සේවා | 250,000 | | | |
| 3-3-411 | වැටුප් හා වේතන | 400,000 | | | |
| 6-4-416 | ජීවන වියදම් දීමනාව | 100,000 | | | |
| | | 7,550,000 | | | 7,550,000 |

| වැය ශිර්ෂය | විස්තරය | අයවැය ගත ඇස්තමේන්තුව | 2010.10.31 දක්වා වියදම | ඇස්තමේන්තු ඉක්ම වූ වියදම | වැය ශිර්ෂ මාරු කිරීමෙන් ලැබෙන මුදල | මැය මාරුවෙන් පසු ඉතිරි ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|---|
| 1-1-453 (ii) | අවශ්‍යතා - ජලය | 25,000 | 40,999 | 15,999 | 30,000.00 | 14,001 |
| 1-4-411 | වැටුප් හා වේතන | 207,000 | 217,095 | 10,095 | 70,000.00 | 59,905 |
| 2-1-416 | ජීවන වියදම් දීමනා | 129,000 | 140,085 | 11,085 | 50,000.00 | 38,915 |
| 2-1-431 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 10,000 | 18,247 | 8,247 | 20,000.00 | 11,753 |
| 2-3-416 | ජීවන වියදම් දීමනා | 194,000 | 207,644 | 13,644 | 75,000.00 | 61,356 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2-9-411 | වැටුප් හා වේතන | 3,156,000 | 5,982,741 | 2,826,741 | 4,226,000.00 | 1,399,259 |
| 2-9-416 | ජීවන වියදම් දීමනා | 129,000 | 851,056 | 722,056 | 1,000,000.00 | 277,944 |
| 2-9-435 | මිළ දී ගැනීම් | 25,000 | 80,000 | 55,000 | 100,000.00 | 45,000 |
| 3-1-431 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 35,000 | 100,304 | 65,304 | 100,000.00 | 34,696 |
| 3-4-411 | වැටුප් හා වේතන | 621,000 | 944,584 | 323,584 | 625,000.00 | 301,416 |
| 5-2-411 | වැටුප් හා වේතන | 336,000 | 773,192 | 437,192 | 829,000.00 | 391,808 |
| 5-2-416 | ජීවන වියදම් දීමනාව | 129,000 | 315,000 | 186,000 | 275,000.00 | 89,000 |
| 6-2-431 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ ( පුවත්පත් ) | 100,000 | 205,387 | 105,387 | 150,000.00 | 44,613 |
| | | 5,096,000 | 9,876,333 | 4,780333 | 7,550,000 | 2,769,667 |

ඉහත ප්‍රතිපාදන ඉතිරි වී ඇති වැය ශිර්ෂ වලින් ප්‍රතිපාදන අවසන් වී ඇති වැය ශිර්ෂ වලට මුදල් මාරුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:23 **ජනාධිපති 2 වන පදවි ප්‍රාප්තිය වෙනුවෙන් ඩිජිටල් බැනර් සැකසීම**

අතිගරු ජනාධිපතිතුමාගේ 2 වන පදවි ප්‍රාප්තිය වෙනුවෙන් " චිරං ජයතු " පාඨය සහිත දැන්වීම් පුවරු 03 ක් සැකසීම වෙනුවෙන් " රසික ඇඩ්වර්ටයිසින් " රත්නපුරපාර , බළන්ගොඩ වෙත රු.13020/- ක මුදල් ගෙවීම සඳහා ඉදිරිපත් කර ඇති බිල්පතක් සභාගත කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ 2 වන පදවි ප්‍රාප්තිය නිමිති කරගෙන බළන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කල දැන්වීම් පුවරුවල " ගරු සභාපතිතුමා ඇතුළු බළන්ගොඩ නගර සභාව" යනුවෙන් පමණක් සඳහන් කර තිබුණු බවත් , එබැවින් , ඒ සඳහා මුදල් ගෙවීමට සිය විරෝධතාව පළකරන බවත් , එය " ගරු සභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා" යනුවෙන් සටහන් විය යුතු බව නාගරික ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් පෙන්වා දෙන ලදී.

සභාපතිතුමා ඇතුළු බළන්ගොඩ නගර සභාව , යන්නෙන් අදහස් කරනු ලබන්නේ " ගරු සභාපතිතුමා , ගරු මන්ත්‍රීතුමන්ලා" වන බව නගර සභා පනත අනුව ගරු සභාපතිතුමන් විසින් පැහැදිලි කරන ලද අතර , මෙම කාර්යය හදිසියේම ඉටුකල බවත් තමන්ගේ නමින් පමණක් මෙය ප්‍රදර්ශනය කලේ නම් එය යුක්ති සහගත නොවන බැව් පැහැදිලි කරන ලදී. විශේෂයෙන් අපගේ පක්ෂය වෙනුවෙන් , අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ඉටුකල යුතු වූ කාර්යයන් සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් ද තමන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය තීරණ තීන්දු වලට එළඹිය යුතු බැව් අවධාරණය කරන ලදී.

සභාවේ සෑම කාර්යයක්ම නගර සභා පනතට අනුව සිදුකලේ දැයි ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විමසු අතර , යම් කිසි කාර්යයක අඩුපාඩු පෙන්වා දුන් විට එය අභියෝගයට ලක්කිරීම සුදුසු නොවන බවත් , මෙම සභාවේ සෑම කටයුත්තකටම ගරු මන්ත්‍රීවරුන් සහයෝගය ලබාදී ඇති බව පැවසීය. අතිගරු ජනාධිපතිතුමන්ගේ පදවි ප්‍රාප්තියට සුභ පැතීම අනිවාර්යයෙන්ම සිදුකල යුතු බවත් , නමුත් තමන් විරෝධතාව ප්‍රකාශ කරනු ලැබුවේ සභාපතිතුමා ඇතුළු බළන්ගොඩ නගර සභාව පමණක් යන්න සඳහන් කර තිබීම නිසාය යන කාරණය අවධාරණයෙන් යුතුව සඳහන් කරන බව දැන්වීය.

අඩුපාඩු පෙන්වීමට පෙර මුදල් ගෙවීමට පළමුවෙන්ම විරෝධතාව පළකිරිම සුදුසු නොවන බවත් , ලේකම්වරයා විසින් සභාව යන්නෙන් අර්ථ නිරූපනය මා වෙත පෙන්වීම ඔහුගේ රාජකාරිය ඉටු කිරීමක් බව ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදී.

මෙම සභාවේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ඉතාමත් සහයෝගීව කටයුතු කල බවත් , එම නිසා සහයෝගීව ගැටළු විසඳා ගැනීම සිදුකිරීම අවශ්‍ය බැව් සෙසු ගරු මන්ත්‍රීතුමන්ලා විසින් පෙන්වා දෙන ලදී.

මේ සම්බන්ධව තවදුරටත් අදහස් ප්‍රකාශ කරගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් මුදල අදාල ආයතනය වෙත ගෙවීමට එම ගරු මන්ත්‍රීතුමා හැර අනෙකුත් බහුතර ගරු මන්ත්‍රීතුමන්ලාගේ එකඟතාව ලබාදීමෙන් අනතුරුව ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:24 **බනස/ක/3/66/55/10 දරණ ගොඩනැගිලි අයදුම්පත සඳහා අනුමැතිය ලබාගැනීම**

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත අංක දරණ ගොඩනැගිලි සැලසුමේ භාවිතය වෙනස් කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති අතර , එහි භාවිතය වෙනස් කිරීම සඳහා වර්ග මීටර් එකකට රු.2000/- බැගින් වර්ග මීටර් 122.97 ක් සඳහා රු.245940/- ක මුදල අයකර ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බැව් එම දන්වා තිබිණ.

අදාල මුදල අයකර අනුමැතිය ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:25 **ඉඩම අසලින් ගලා බසින කාණුව පිළිසකර කරගැනීම**

ඉහත කරුණට අදාළව සමන් ජයතිස්ස මහතා විසින් ඉදිරිපත් කර ඇති 2010.10.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ මිරිස්වත්ත , කහටපිටිය ප්‍රධාන මාර්ගය අයිනෙන් ජලය ගලා බසින කාණුව සකස් කරදෙන ලෙස ඉල්ලා , බළන්ගොඩ , කහටපිටිය,අංකඃ 48 දරණ ලිපිනයේ පදිංචි සමන් ජයතිස්ස මහතා විසින් ඉදිරිපත් කර ඇති 2010.10.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2011 අයවැය යෝජනා වලට ඇතුළත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:26 බළන්ගොඩ නගර සභා තානායම නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත සඳහන් ගොඩනැගිල්ල ඍජු ශ්‍රමය යටතේ ඉටුකිරීමට සභාව තීරණය කර ඇති අතර , එම ගොඩනැගිල්ලේ ස්ලැබ් එක සහ බිත්ති අඩු වියදමින් ලාභදායීව ඉටුකිරීමට මිළ ගණන් කැඳවන ලෙස ගරු සභාපතිතුමන් උපදෙස් ලබා දී ඇති බැවින් , ඒ සඳහා පළාත් පාලන ඉංජිනේරුවරයාගේ අනුමැතිය අනුමැතිය අවශ්‍ය බැව් එමගින් දන්වා තිබිණ.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව පළාත් සභාවේ අනුමැතිය සහ උපදෙස් වලට යටත්ව ගොඩනැගිල්ලේ බිත්ති සහ කොන්ක්‍රීට් තට්ටුව ඊ.එල්.සී.ආයතනය මගින් ඉටුකරගැනීම සලකා බැලීම සුදුසු බවට අනුමත කරන ලදී.

**06. මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම් )**

| දිනය | විස්තරය | ව.අ | චෙක්පත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2010-10-26 | නවමිණි , රත්නපුර<br>තානායම සඳහා අවශ්‍ය විදුලි උපකරණ ලබාගැනීම | 116 | 204223 | 153039.60 |

| | | | | |
|---|---|---|---|---|
| | මොඩ් ස්පොට් ඉලෙක්ට්‍රොනික්ස් 2010 නොවැම්බර් මාසය | 117 | 204224 | 129600.00 |
| 2010.11.01 | ජී.බී.පුෂ්පා රංජනී ( මාස්ටර් මීඩියා සොලූෂන්ස් ) තානායම සමරු පලකයට මුදල් ගෙවීම | 02 | 204225 | 12500.00 |
| | ජී.බී.පුෂ්පා ( මාස්ටර් මීඩියා සොලූෂන්ස් ) තානායම නාම පුවරුව සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 03 | 204225 | 26270.00 |
| | චන්දිමා සුගතදාස අභියාචනා නඩු අංකඃ 32/08 වෙනුවෙන් වෘත්තීමය ගාස්තු ගෙවීම | 05 | 204227 | 15000.00 |
| | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය, කිරිදිගල රබර්වත්ත සියඹලාගහවත්ත මාවත සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ රැදවුම් හා ගිවිසුම් ඇප ආපසු ගෙවීම | 07 | 204229 | 34413.14 |
| 2010.11.02 | බී.ගුණරත්න බළන්ගොඩ නගරයේ කැළි කසල එකතු කිරීම 2010.10.16 - 2010.10.31 දක්වා | 08 | 204230 | 100583.33 |
| | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය තානායම මිදුල සඳහා ඉන්ටර්ලොකින් කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම ව්‍යාපෘතියේ අවසන් ගෙවීම | 09 | 204231 | 332494.91 |
| | තලංගම පැරකුම් ගොවි සංවිධානය සරස්වතීවත්ත පාර කනත්ත කෙළවර පඩිපෙළ ඉදිකිරීමේ කර්මාන්තයේ රැදවුම් හා ගිවිසුම් ඇප ආපසු ගෙවීම | 10 | 204232 | 21604.68 |
| 2010.11.03 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඞ් දුරකථන බිල්පත් පියවීම 2287023/3452939/2287022/2287022/2288565/3452932/3452931 | 16 | 204235 | 17351.16 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඞ් දුරකථන බිල්පත් පියවීම - 2010 සැප්තැම්බර් මාසය දු.අ.2287275/2287153/2286596/2288737/E-Mail | 17 | 204235 | 18900.05 |
| | ජයන්ති ටයර් සෙන්ටර් 226-7521 ටිපර් රථයට 700x16 ටයර් ලබාගැනීම | 18 | 204236 | 29800.00 |
| | මහජන බැංකුව ආදීපාද වීදිය, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක 2009 අප්‍රේල්,මැයි,ජුනි,මාසික බිල්පත් පියවීම | 19 | 204237 | 62540.10 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය බළන්ගොඩ හුණුකුඹුර මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම ( පාලම අසල ) 10% රැදවුම් හා ගිවිසුම් ඇප ආපසු ගෙවීම | 20 | 204238 | 12270.10 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය 2010.08.23 සිට 2010.08.26 දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 21 | 204239 | 71244.60 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය ඉදිකිරීම් කටයුතු සඳහා සිමෙන්ති මිටි 50 ලබාගැනීම | 22 | 204239 | 35500.00 |
| | පී.එස්.ටයර් වර්ක්ස් එච්.එෆ්.8558 ට්‍රැක්ටරය සඳහා 11x28 ටයර් දෙකක් නැවත පිරවීම | 23 | 204240 | 29800.00 |
| | පළාත් ආදායම් කොමසාරිස්, 2010 මැයි,ජුනි හා ජූලි මාසවල පිරිවැටුම් බදු පළාත් ආදායම් කොමසාරිස් වෙත ගෙවීම | 24 | 204241 | 17193.03 |
| | දේශීය ආදායම් කොමසාරිස් 2010 මැයි, ජුනි හා ජූලි මාසවල රඳවා ගැනීමේ බදු පළාත් ආදායම් කොමසාරිස් වෙත යැවීම | 26 | 204143 | 118646.99 |

| | | | | |
|---|---|---|---|---|
| 2010.11.09 | දේශානී හාඩ්වෙයාර්<br>තානායම ජල සැපයුම් කටයුතු සඳහා අවශ්‍ය ජල සැපයුම් උපාංග ලබාගැනීම | 29 | 204245 | 13895.00 |
| | ඩී.බී.ලීලසේන<br>ජී.කේ.6227 ට්‍රැක්ටරය යක්කල දේව් සමාගමේ සිට බළන්ගොඩ දක්වා ප්‍රවාහනය වෙනුවෙන් මුදල් ගෙවීම. | 31 | 204248 | 12000.00 |
| 2010.11.11 | පී.එල්.ජී.සී.විජේවර්ණසූරිය<br>නගර සභාව මගින් සංවිධානය කරන වැඩ සටහන් වීඩියෝ කිරීම වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ලබාදීම | 33 | 204259 | 15000.00 |
| | සභාපති, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>මිරිස්වත්ත ශ්‍රී ගුණානන්ද මාවත බැම්ම බැද කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම අවසන් ගෙවීම | 34 | 204260 | 210874.33 |
| | සභාපති, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>මිරිස්වත්ත ශ්‍රී ගුණානන්ද මාවතේ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම i අදියර 20% අත්තිකාරම් මුදල ගෙවීම | 35 | 204260 | 100000.00 |
| | නැෂනල් මෝටර්වේස්<br>56-1906 කෘෂ කැබ් රථය එන්ජිම අලුත්වැඩියා කිරීම | 36 | 204261 | 88367.00 |
| 2010.11.15 | නුවන් දේශාන් ගුණතුංග<br>හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සඳහා මුදල් ගෙවීම | 49 | 204269 | 52496.00 |
| 2010.11.19 | එම්.ජී.පියසේන<br>2010.10.12 - 2010.11.08 දක්වා සභාවට අයකර දී ඇති පොදු වෙළඳසැල ගාස්තු වලින් 15% තැන්පත් මුදල් ආපසු ගෙවීම | 53 | 204273 | 21000.00 |
| | බී.ගුණරත්න<br>බළන්ගොඩ නගරයේ කැළි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සේවකයන් යෙදවීම | 54 | 204274 | 100583.33 |
| | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>2010 ජුලි , අගෝස්තු හා සැප්තැම්බර් මාසවල ජාතිය ගොඩනැගීමේ බදු මුදල දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීම | 57 | 204277 | 93484.01 |
| | සභාපති, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>මැද කිරිඳිගල මාර්ගය ආරම්භක කොටස කාණුව ඉදිකර දෙවන බෝක්කුව අසල කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමේ කර්මාන්තය සඳහා 10% රැඳවුම් මුදල් හා ගිවිසුම් ඇප තැන්පත් ගෙවීම | 58 | 204278 | 23506.87 |
| | සභාපති, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>මැද කිරිඳිගල ආරම්භක කොටස කාණුව ඉදිකර දෙවන බෝක්කුව අසල කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමේ කර්මාන්තයේ අතිරේක වැඩ කොටස සඳහා 10% රැඳවුම් මුදල් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පත් ගෙවීම<br>**2010.10.26 සිට 2010.11.23 දක්වා - ලංකා බැංකුව** | 59 | 204278 | 4794.27 |
| 2010.11.04 | සැම් ඩැම් කන්ස්ට්‍රක්ෂන්<br>බළන්ගොඩ සතිපොළ ඉදිකිරීම අවසන් කොටස ගෙවීම | 01 | 000073 | 2835461.67 |
| | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>බළන්ගොඩ සතිපොළ ඉදිකිරීම අවසන් කොටස ගෙවීමේ වැට් 1/3 දේ.ආ.කො.වෙත ගෙවීම | 01 | 000074 | 105017.10 |

| | | | | |
|---|---|---|---|---|
| 2010.11.11 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>2010 ඔක්තෝබර් මස නව බස්නැවතුම්පල විදුලිය බිල්පත පියවීම | 02 | 000075 | 50653.20 |
| 2010.11.23 | කොඩිකාර කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්<br>බළන්ගොඩ මහජනපොළ වැසිකිළි පද්ධතිය මාළුකඩ හා මුරකුටිය ඉදිකිරීම පළමු බිල්පත ගෙවීම | 03 | 000076 | 752329.19 |
| | 2010.10.21 සිට 2010.11.19 දක්වා - තානායම | | | |
| 2010.10.21 | ඩිස්ටලරි කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා<br>තානායම සඳහා අවශ්‍ය රටබීම ලබාගැනීම | 48 | 203336 | 66294.00 |
| 201010.25 | කළමණාකරු, ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>ඔක්තෝබර් මස බළන්ගොඩ තානායමේ ජල බිල්පත පියවීම | 50-1 | 203338 | 17152.80 |
| 2010.10.27 | විනෝරා ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායමට අවශ්‍ය සෝඩා හා පැණි බීම වර්ග ලබාගැනීම | 57 | 203345 | 13821.36 |
| | ප්‍රියංවදා එන්ටර්ප්‍රයිසස්<br>තානායමට අවශ්‍ය හිස් ගෑස් සිලින්ඩර් 02 හා එය පිරවීම සඳහා වැය වූ මුදල ගෙවීම | 59-1 | 203346 | 19517.00 |
| 2010.11.04 | ප්‍රියන්ත මුතුමාල<br>තානායම සඳහා අවශ්‍ය මාළු ලබාගැනීම | 03 | 203347 | 14820.00 |
| | ප්‍රියන්ත මුතුමාල<br>තානායම සඳහා අවශ්‍ය මාළු ලබාගැනීම | 06 | 203347 | 13480.00 |
| | ශ්‍රී ස්ටෝර්ස්<br>තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 08 | 203348 | 10843.00 |
| | ශ්‍රී ස්ටෝර්ස්<br>තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 11 | 203348 | 25476.00 |
| | ශ්‍රී ස්ටෝර්ස්<br>තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 12 | 203348 | 27976.00 |
| | ශ්‍රී ස්ටෝර්ස්<br>තානායම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 13 | 203348 | 10906.00 |
| | ජී.වී.එස්.ටී.කුරේ<br>තානායම සඳහා කුකුල් මස් ලබාගැනීම | 15 | 203349 | 34200.00 |
| | ප්‍රියන්වදා එන්ටර්ප්‍රයිසස්<br>තානායම සඳහා ගෑස් ලබාගැනීම | 16 | 2033350 | 27246.00 |
| | ඩිස්ටලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී<br>තානායම සඳහා රටබීම ලබාගැනීම | 17 | 203251 | 75649.08 |
| | ආර්.ජේ.කේ.වී.නිශාන්ත<br>තානායමට අවශ්‍ය එළවළු ලබාගැනීම | 21 | 203254 | 17655.00 |
| | ඉන්දික එරික් සිසිල්<br>තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 23 | 203256 | 10670.00 |
| | ඩිස්ටලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා තානායම සඳහා අවශ්‍ය රටබීම ලබාගැනීම | 28 | 203263 | 45566.88 |
| 2010.11.19 | කළමණාකරු, මහජන බැංකුව, බළන්ගොඩ<br>තානායම් ගිණුමෙන් වැටුප් ගෙවීම සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් ආපසු 6351750 ගිණුමට බැර කිරීම | 35 | 203269 | 109548.54 |
| | ඩිස්ටලරි කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී<br>තානායම සඳහා රටබීම ලබාගැනීම | 36 | 203270 | 17370.84 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. ඇස්තමේන්තු අනුමත කිරීම :

පහත සඳහන් සභා කර්මාන්ත වලට අදාළ ඇස්තමේන්තු ආවරණ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

01. බළන්ගොඩ තානායම පොල් අතු සෙවිලි කළ ගොඩනැගිල්ල ඉදිකිරීම ( සංශෝධිත ) රු. 475005.46
02. බළන්ගොඩ තානායම අසල රථවාහන නැවතුම් ස්ථාන සෑදීම උද්‍යාන ආවරණ දෙකක් සෑදීම.තානායම් ළිඳට ආවරණ යෙදීම රු. 125826.75
03. බළන්ගොඩ තානායම පොල් අතු සෙවිලිකළ වැසිකිළිය ඉදිකිරීම රු.125826.75

මේ සඳහා සභාවේ ආවරණ අනුමැතිය ලබාදුන් අතර , අදාල කර්මාන්ත සෘජු ශ්‍රමයෙන් ඉටුකිරීමට අනුමැතිය ලබාදෙන ලදී.

| කර්මාන්තය | ඇස්තමේන්තු මුදල | සමිතිය |
|---|---|---|
| 01. ඇල්ලෙපොල කොටබෝධිය අසල පාලම අසල පහලට මාර්ගය බැම් බැදීම | 502,770.16 | අරුණාලෝක ග්‍රාම සංවර්ධන සමිතිය , පල්ලෙකන්ද,බළන්ගොඩ |
| 02. වැලිහරනාව බැංකියවත්ත මාර්ගයේ සිට පහලට ජල ටැංකියට යන මාර්ගය සංවර්ධනය කිරීම | 501,718.47 | කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය |
| 03. කරව්කැටිය මාර්ගයේ සිට රිෂාඩ් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තය | 511,288.99 | සභාව මගින් සෘජු ශ්‍රමයෙන් |
| 04. සී.සී.දෙමළ මහා විද්‍යාලය පසුපස මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇල්ලීම | 511,590.78 | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය |
| 05. හුණුකුඹුර ගාලෙවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | 500,844.66 | සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය |
| 06. හුණුකුඹුර කෝපිවත්ත සුනිල් ගරාජය අසල මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමට හැකි අයුරින් බැම්ම බැදීම | 500,046.08 | සභාව මගින් සෘජු ශ්‍රමයෙන් |
| 07.මහමෙව්නා මාවත 2 පටුමග කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 502,069.66 | කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය |
| 08. මහමෙව්නා මාවත 1 පටුමග කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 500,886.01 | කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය |
| 09. සුදර්ශනපුර නිවාස යෝජනා ක්‍රම පාර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 500,575.17 | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය |
| 10. කුමාරගම සුසාන භූමිය මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇල්ලීම | 500,302.85 | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය |
| 11. උඩකන්ද ගල්වල මාර්ගය අවසන් අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇල්ලීම | 501,092.22 | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය |
| 12. හුණුකුඹුර මාර්ගය පාලම අසල කුඹුර සහිත කොටස බැම් බැඳ කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම ( නියාමක ව්‍යාපෘති 2 අදියර) | 501,571.08 | සිරි විජය ග්‍රාම සංවර්ධන සමිතිය |
| 13. වැකුඹුර කනත්ත පාර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 500,930.31 | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය |
| 14. වැලිහරනාව ජල ටැංකිය පාර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 500,805.62 | කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය |
| 15. හුණුකුඹුර පාලම අසල කුඹුර සහිත | 477,749.72 | සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය |

| | | |
|---|---|---|
| කොටස අනෙක්පස බැම්ම බැදීම ( සභා අරමුදල් ) | | |

ඇස්තමේන්තු අනුමත කල සභාව ඉහත සඳහන්කර ඇති පිළිගත් සමිති මගින් හා සභාව මගින් අදාළ කර්මාන්තයන් ඉටුකිරීමට අනුමැතිය ලබාදෙන ලදී.

**08.1 යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත

**යථා පරිදි කල් දී ඇති යෝජනා :**
නැත.

**09. ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම**

09:01 **226-7521 ටිපර් රථයට බැටරි 02 ක් මිළදී ගැනීම:**

මෙම නගර සභාව සතු 226-7521 ටිපර් රථයට ඇම්පියර් 90 බැටරි 02 ක් මිළදී ගැනීමට කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| ජයන්ති ටයර් සර්විස් | සිටි ටයර් සර්විස් | බළන්ගොඩ ටයර් සර්විස් |
|---|---|---|
| 13900/- | 14150/- | 14500/- |

ඉහත මිළ ගණන් අතුරින් අවම මිළ ඉදිරිපත් කර ඇති ජයන්ති ටයර් සෙන්ටර් වෙතින් අවශ්‍ය බැටරි 02 ක් මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:02 **227-5020 ගලි බවුසරයට ටයර් හා ටියුබ් මිළදී ගැනීම:**

ඉහත අංක දරණ වාහනයට 700x16 ටයර් 02 ක් හා ටියුබ් 02 ක් මිළදී ගැනීමට ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| ජයන්ති ටයර් සෙන්ටර් | සිටි ටයර් සර්විස් | බළන්ගොඩ ටයර් සර්විස් |
|---|---|---|
| ටයර් 01 14900/-<br>ටියුබ් 01 1550/- | ටයර් 01 14550/-<br>ටියුබ් 01 1575/- | ටයර් 01 16000/-<br>ටියුබ් 01 1575/- |

ඉහත මිළ ගණන් අතුරින් ජයන්ති ටයර් සෙන්ටර් ආයතනයේ අවම මිළ ගණනට ටයර් 02 ක් හා ටියුබ් 02 ක් මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:03 **බොබ් කැට් යන්ත්‍රයේ විදුලිය පද්ධතිය සකස් කිරීම :**

බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු සඳහා යොදාගෙන ඇති බොබ්කැට් යන්ත්‍රයේ විදුලිය පද්ධතියේ දෝෂ පවතින බැවින් එය යථා තත්ත්වයට පත්කරගැනීම සඳහා " Fuel Solenoid " එක යෙදිය යුතු වන බැවින් , ඒ සඳහා මිළ ගණන කැඳවන ලදී. ඩැක්ස් ඉංජිනියරින් ආයතනය වෙතින් ඒ සඳහා වැට් සමග රු.59268.09 ක මිළ ගණනක් ඉදිරිපත් කර තිබුණි.

එම මිළ ගණන පිළිගෙන බොබ්කැට් යන්ත්‍රයේ විදුලි පද්ධතිය යථා තත්ත්වයට පත්කරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:04 **බළන්ගොඩ තානායමේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය සකස් කිරීම:**

බළන්ගොඩ තානායමේ අභ්‍යන්තර දුරකථන පද්ධතියේ කොටසක් සකස් කිරීමට අදාළ රත්නපුර මෙට්‍රොපොලිටන් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද රු.18,984 /- ක් වු මිළ ගණන සභාවට ඉදිරිපත් කරන ලදී.

එම මිළ ගණන් පිළිගෙන අදාල කාර්යය ඉටුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:05 බළන්ගොඩ නගර සභා තානායම නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම :

බළන්ගොඩ තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම කර්මාන්තයේ පළමු අදියරේ කොන්ක්‍රීට් වැඩ කොටස් සඳහා කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| අයිතමය | නාලක කටුපිටිය , නාලක කන්ස්ට්‍රක්ෂන් ,මොරහැල, බළන්ගොඩ | පී.ශෂි කුමාරි ගල්වල පාර, උඩකන්ද ,බළන්ගොඩ | වී.එල්.රංජිත් වීරසුරිය , නො.67, උඩකන්ද ,බළන්ගොඩ | නුවන් දේශාන් ගුණතුංග , අලාබ්දීන් මාවත,බළන්ගොඩ | එන්.ආර්.දයානන්ද පොල්වත්ත, රාස්සගල,බළන්ගොඩ |
|---|---|---|---|---|---|
| 4x4 බේස් වලක් කපා කණුව තබා පාදම කොන්ක්‍රීට් කිරීම ( එක් වලක් සඳහා ) | 3250/- | 3000/- | 3150/- | 3200/- | 3100 |
| බේස් වලක් සඳහා මඩ කොන්ක්‍රීට් යෙදීම වර්ගඅඩි 1 සඳහා | 27/- | 25/- | 26/- | 27/- | 26/- |
| 3'x3' බේස් වලක් කපා කණුව තැබීම ( 1 වලක් සඳහා ) | 2600/- | 2500/- | 2700/- | 2600/- | 2700/- |
| 9"x9" කොන්ක්‍රීට් කණු කොන්ක්‍රීට් කිරීම ඇතුළු සියළු වැඩ නිම කිරීම ( ශටරිම සපයාගත යුතුය. දික් අඩි 01 සඳහා ) | 120/- | 100/- | 125/- | 140/- | 115/- |
| 12"x12" කොන්ක්‍රීට් කණු කොන්ක්‍රීට් කිරීම ඇතුළු සියළු වැඩ නිමකිරීම ( ශටරිම සපයා ගත යුතුය.) | 160/- | 150/- | 155/- | 165/- | 155/- |
| බීම් දික් අඩියක් කොන්ක්‍රීට් කර සියළු වැඩ නිමකිරීම ( ශටරිම සපයා ගතයුතුය) | 160/- | 150/- | 155/- | 165/- | 155/- |
| කොන්ක්‍රීට් තට්ටුව ( ස්ලැබ් ) සියළු වැඩ නිමකර කොන්ක්‍රීට් කිරීම ( ශටරිම සපයාගත යුතුය. වර්ග අඩියක් සඳහා) | 90/- | 85/- | 90/- | 87/- | 92/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති පී.ශෂි කුමාර් මහතාගේ මිළ ගණන පිළිගෙන අදාළ වැඩ කොටස් ඔහු වෙතින් ඉටුකරවා ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10. **යෝජනා :**

10:01 **N.D.5124 වෑන් රථය අළුත්වැඩියා කිරීම**

අංකːN.D.5124 වෑන් රථය දැනට කි.මී.175000 ඉක්මවා ධාවනය කර ඇති බැවින් , පහත සඳහන් අළුත්වැඩියාවක් සිදුකල යුතු බැව් රියදුරු විසින් දන්වා ඇති බැවින් , එය අළුත්වැඩියා කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

- ටයිමින් බෙල්ට් යොදා පූර්ණ සේවා කිරීමක් කිරීම
- ක්ලච් පද්ධතිය අළුත්වැඩියා කිරීම
- වායු සමීකරණ පද්ධතිය සේවා කරගැනීම
- පිටුපස දොර අළුත්වැඩියා කිරීම
- වම්පස හා දකුණු පස අපර් ආම් දැමීම

ටොයෝටා ලංකා සමාගමේ කාර්මික ඉංජිනේරුගේ නිර්දේශය ලබාගෙන අදාළ අළුත්වැඩියාව හා සේවාවන් ටොයොටා ලංකා පුද්ගලික සමාගම වෙතින් ඉටුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**11. කාරක සභා වල වාර්තා සලකා බැලීමː**

11:01 2010.11.02 වන දින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව හා තානායම් කමිටු රැස්වීමේ වාර්තාව සභාගත කරන ලදී.

එම වාර්තාවේ " 2 වන පිටුවේ කඩිනමින් කර්මාන්ත ඉටුකල යුතු බැවින් , සෑම සතියක් සඳහාම අත්තිකාරම් මුදලක් ලබාදීමටත් " යනුවෙන් සඳහන් වී ඇති බවත් , එය " සෑම සමිතියක් සඳහාම අත්තිකාරම් මුදලක් ලබාදීමටත් " යනුවෙන් සංශෝධනය විය යුතු බව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් දැන්වීය එම සංශෝධනයට යටත්ව 2010.11.02 වන දින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තා සභාව විසින් අනුමත කරන ලදී.

11:02 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 පෙබරවාරි 19 වන දින අංකː 1589/20 අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් බළන්ගොඩ නගර සභාව වෙත පවරා ඇති බළන්ගොඩ තානායමේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු වූ රෙගුලාසී මාලාවක් සභාවට ඉදිරිපත් කරන ලදී.

එම රෙගුලාසී මාලාව තානායම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

මෙම ගිණුම සභාව විසින් අනුමත කරන ලදී.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීමː**

12:01. 2010 වර්ෂයේ ඔක්තෝබර් මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 5,121,222.26 |
| වෙනත් ලැබීම් | 10,243,492.02 |
| **මුළු ලැබීම්** | **15,364,714.28** |
| පුනරාවර්ථන වියදම් | 3,226,265.14 |
| වෙනත් වියදම් | 5,146,936.52 |
| **මුළු වියදම්** | **8,373,201.66** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2010.10.01 සිට 2010.10.31 දින දක්වා මෙම නගර සභාව සතු වාහන වෙනුවෙන් වැය වන ලද ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව සභාව විසින් අනුමත කරනලදී.

12:03 **බළන්ගොඩ නගර සභා තානායමේ ලාභ අලාභ ගිණුම ඉදිරිපත් කිරීම**

බළන්ගොඩ නගර සභා තානායමේ 2010.11.10 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වු ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| විකුණුම් | 3,088,806.41 |
| විකුණුම් පිරිවැය | 2,581,470.07 |
| දළ ලාභය | 507,336.34 |
| අනෙකුත් වියදම් | 542,002.10 |
| **ශුද්ධ අලාභය** | **34,665.76** |

බළන්ගොඩ නගර සභා තානායමේ 2010.10.22 දින සිට 2010.11.10 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා වු ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| විකුණුම් | 804,604.02 |
| විකුණුම් පිරිවැය | 504,429.84 |
| දළ ලාභය | 300,174.18 |
| අනෙකුත් වියදම් | 130,379.05 |
| **ශුද්ධ ලාභය** | **169,795.13** |

ඉහත සඳහන් ගිණුම් වාර්තා සභාව විසින් අනුමත කරන ලදී.

12:04 2011 වර්ෂය සඳහා කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම

2011 වර්ෂය සඳහා සකස් කර ඇති අයවැය කෙටුම්පත් ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| 2011 වර්ෂයේ පුනරාවර්ථන ආදායම | 69,646,000.00 |
| මුළු පුනරාවර්ථන වියදම | 63,037,000.00 |
| පුනරාවර්ථන අතිරික්තය | 6,609,000.00 |
| ප්‍රාග්ධන වියදම | 6,609,000.00 |
| අතිරික්තය/ ඌණතාවය | - |

මෙම අයවැය මගින් බදු වැඩිකිරීමට සිදුකර නොමැති බැව් පැවසූ ගරු සභාපතිතුමා, පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ට 2011 වර්ෂයේ දී සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.ලක්ෂය බැගින් මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇති බව පැවසීය. බළන්ගොඩ නගර සභා නානායම නවීකරණය කර ජනතා අයිතියට පවරා ඇති බැවින් , ඒ තුලින් ලැබේ යැයි අපේක්ෂි ආදායම ද ඇස්තමේන්තු කර ඇති අතර , ඊට අමතරව , ආදායම් උත්පාදන ව්‍යාපෘති හා සංවර්ධන කාර්යයන් හා සුභසාධක සේවාවන් සඳහා ද මෙම අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති බව වැඩිදුරටත් අදහස් දක්වමින් පවසන ලදී.

2011 වර්ෂය වෙනුවෙන් සකස් කර ඇති අය වැය ලේඛනය සභා සම්මත කිරීමට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කළ අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා බෙදීමක් නොතිබුන අතර ඒකමතිකව අයවැය ලේඛනය සභා සම්මත කරන ලදී.

12:05 **2010 සංවර්ධන කටයුතු සඳහා වන පරිපූරක ඇස්තමේන්තුව**

2010 සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති පරිපූරක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

| | | | | | |
|---|---|---|---|---|---|
| 3-0-381 | අයවැය ගත ඇස්තමේන්තු ඉක්ම වූ ප්‍රදානයන් | 6,000,000 | 3-3-518 | අනෙකුත් ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු | 6,000,000 |
| | | 6,000,000 | | | 6,000,000 |

මෙම පරිපූරක ඇස්තමේන්තුව සභාගත කිරීම සුදුසු බවට ගරු සභාපති , ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

13. **වෙනත් කරුණු ඃ**

14. **අවසානයඃ-**

**14:01 ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී,එම්.රූමි මැතිතුමා ඃ**

අතිගරු ජනාධිපතිතුමන්ගේ 2 වන පදවි ප්‍රාප්තියට සිය උණුසුම් සුභ පැතුම් එක්කරන බව දැන් වූ ගරු මන්ත්‍රීතුමා , අතිගරු ජනාධිපතිතුමන්ට තවත් වසර 06 ක කාලයක් මේ රට පාලනය කිරීමට ශක්තිය හා ධෛර්යය ලැබේවා යි සුභ ප්‍රාර්ථනා කරන බව දැන්වීය.

තව දුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා , බෙතල්හිල් මාවතේ ට්‍රැක්ටර් රථයක් හැරවීමට නොහැකි නිසා එම මාර්ගයේ කුණු කසල ඉවත් කිරීමට නොහැකි වී ඇති බැව් පැවසීය. මේ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන කුණු කසල ඉවත්කිරීමට අවශ්‍ය සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. එසේම මිරිස්වත්ත තලාව පාරේ අවසාන කොටසේ ද කුණු කසල ඉවත් කිරීමට නොහැකිව තිබෙන බවත් , එම ප්‍රදේශයේ අයෙකු මාර්ගය හරස් කර වැටක් ගසා ඇති බැවින් , කුණු කසල ගැනීම සඳහා ට්‍රැක්ටර් රථ වලට යාමට නොහැකි වී ඇති බැව් පෙන්වා දුන් අතර , එම අවහිරතාව ඉවත් කර එම ප්‍රදේශයේ කුණු කසල ගැනීමට ක්‍රමයක් සලසා දෙන මෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් ඉතාමත් සුහදව සභාවේ වැඩ කටයුතු වලට සහය දැක්වනු ලැබූ බවත් , ඉදිරියට ද එම සුහදතාව වර්ධනය කරගනිමින් කණ්ඩායමක් ලෙස සහයෝගය කටයුතු කර ජනතාව බලාපොරොත්තු වන සේවය ලබාදීමට කටයුතු කරමු යැයි පැවසීය.

14:02 ගරු නාගරික මන්ත්‍රී , එම්.නිමල් කරුණාරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , ඕළුගන්තොට රෝහල අසල තිබු මගී ආවරණය මාර්ගය සංවර්ධනය අධිකාරිය විසින් , මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඉවත් කර ඇති බවත් , එය බළන්ගොඩ සමාජසේවා පදනමේ අනුග්‍රහයෙන් සකස්කරදීමට එකගතාවය පළකර ඇතිබැවින් , මාර්ගය සංවර්ධන අධිකාරිය වෙත දන්වා එම මගී ආවරණය නැවත එම ස්ථානයේම ඉදිකිරීමට අවසර ලබාගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

ප්‍රජා සත්කාරයක් වශයෙන් මෙම මගී ආවරණය ඉදිකිරීමට අනුග්‍රහය දැක්වීම සම්බන්ධව බළන්ගොඩ නගර සභාවේ ස්තුතිය බළන්ගොඩ සමාජ සේවා පදනම වෙත පළකරන බව දන්වා යවන ලෙස ද ඉල්ලීමක් කරන ලදී.

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 01.40 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.